# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2017/2018

## PSC- 3146 ජනවාර්ගිකත්වය, ජාතිය සහ ජාතික රාජ්‍යය

**කාලය : පැය දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20 ).**

---

01. ජනවාර්ගිකත්වය පිළිබඳ සංකල්පය සහ එහි ප්‍රභවය පිළිබඳ කෙටියෙන් විමසන්න.

02. (අ) ජාතිකවාදය යන සංකල්පය නිර්වචනය කරන්න.
    (ආ) ජාතිකවාදයෙහි සමාජ දේශපාලන දැනවීම් මොනවා දැයි පැහැදිලි කරන්න.

03. (අ) යුරෝපයේ ජාතික රාජ්‍යයේ විකාශනය කෙටියෙන් පහදන්න.
    (ආ) ජාතික රාජ්‍යයේ මූලික ලක්ෂණ සහ එහි අනාගතය පිළිබඳ ප්‍රතිවිරුද්ධ අදහස් මොනවා දැයි විමසන්න.

04. (අ) ඔබ ජාතිය ගොඩ නැගීම පිළිබඳ සංකල්පය හඳුනා ගන්නේ කෙසේ ද?
    (ආ) ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලිය විෂයෙහි ඇති අභියෝග කෙටියෙන් විශ්ලේෂණය කරන්න.

05. (අ) සාමය ගොඩනැගීම පිළිබඳ සංකල්පය බෙදීම් සහිත (fragile states ) පශ්චාත් යටත් විජිත රාජ්‍යයන්හි භාවිත කර ඇත්තේ කෙසේ ද?
    (ආ) සාමය ගොඩනැගීම යන තර්කය පදනම් ව මෙම රටවල කෙරෙන බාහිර පාර්ශවයන්ගේ මැදිහත්වීම සම්බන්ධව ඉදිරිපත් ව ඇති විවේචන මොනවා ද?

06. (අ) ජනවාර්ගික සම්බන්ධතා පර්යාලෝකයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලනික ගැටළු ඔබ හඳුනා ගන්නේ කෙසේ ද?
    (ආ) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් සෙවීමේ දී ඔබ දකින ප්‍රධාන බාධා මොනවා ද?

***************************